සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 2025
# Second Term Test - 2025

11 ශ්‍රේණිය | චිත්‍ර - I | කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(01) ලක්දිව ගෘහ නිර්මාණ ශිල්පයේ සුවිශේෂී නිර්මාණයක් වන මෙය .................................................................. ලෙස හඳුන්වා දිය හැකිය.

(02) පොළොන්නරුවේ රාජ්‍යත්වයට පත් ..................................................................රජු විසින් ක්‍රි. ව. 12 වෙනි සියවසේ දී මෙය කරවා තිබේ.

(03) මෙම ගල්කනු දක්වා ඇති මණ්ඩපය ............................................................................ හැඩයකින් යුක්තය.

(04) මෙහි මණ්ඩපය මධ්‍යයෙහි කුඩා .................................................................. හැඩයෙන් යුතු දාගැබක් දක්නට ලැබේ.

(05) මෙම ගොඩනැගිල්ල, එය කර වූ රජුගේ ............................................................................ වැනි ආගමික කටයුතු සඳහා ඉදිකළ බව එහි ඇති සෙල්ලිපියක සඳහන් වේ.

- අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(06) 43 කණ්ඩායමට අයත් ශිල්පියෙකු වූ කේ. කනකසබාපති ශිල්පියාගේ පසුකාලීන නිර්මාණවලට ආභාසය වූයේ කුමන ශෛලියක් ද? ............................................................................................................

(07) රජ පවුල නමැති උද්‍යාන මූර්තිය නිර්මාණය කරන ලද එංගලන්ත ජාතික මූර්ති ශිල්පියා කවු ද?

............................................................................................................

(08) ලක්දිව ගෘහ නිර්මාණ ශිල්පයේ සුවිශේෂ නිර්මාණයක් ලෙස සැලකෙන ගඩලාදෙණිය විහාරයේ ගෘහ නිර්මාණ ශිල්පියා කවුරුන් ද? ..........................................................................................................

(09) තමාට ම ආවේණික නිර්මාණ ශෛලියක් යොදාගනිමින් ''පාට්ටුත්තිරත්තාලේ'' නම් පොත් කවරය නිර්මාණය කරන ලද ශිල්පියා කවු ද? ..........................................................................................

(10) කාලිදාස විසින් රචිත කාව්‍යයක ප්‍රධාන චරිතය ඇසුරෙන් පැස්ටල් මාධ්‍යයෙන් වර්ණගැන් වූ ඒ. මාර්ක් ශිල්පියාගේ සිතුවම කුමක් ද? ..........................................................................................................

- **අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) සීගිරි සිතුවම් තුළින් දැක්වෙන කාන්තා රූප, ''මේඝ ලතා සහ විජ්ජුලතා'' සංකේතවත් කරයි. යන මතය ඉදිරිපත් කළේ,

(1) H. C. P. බෙල් මහතාය. (2) D. T. දේවේන්ද්‍ර මහතා ය.

(3) සෙනරත් පරණවිතාන මහතා ය. (4) ආනන්ද කුමාරස්වාමි මහතා ය.

(12) පොළොන්නරු යුගයේ හමු වූ හින්දු දේව ප්‍රතිමා බොහොමයක් නිර්මාණය කර ඇති මාධ්‍යය,

(1) කළුගල් ය. (2) ලෝකඩ ය. (3) හුණුගල් ය. (4) මැටි ය.

(13) තිවංක පිළිමගෙය මුල්කාලීන චිත්‍ර ලෙස සැලකෙන ගර්භ ගෘහයේ හා අන්තරාලයේ සිතුවම් නිර්මාණය කරන ලද්දේ,

(1) පොළොන්නරු යුගයේ දී ය. (2) අනුරාධපුර යුගයේ දී ය.

(3) මහනුවර යුගයේ දී ය. (4) දඹදෙණි යුගයේ දී ය.

(14) බෝධිසත්ව චරිතය විදහාපාන තේමිය ජාතකයේ සුවිශේෂ සිතුවම් කොටසක් දැකිය හැක්කේ,

(1) විද්‍යාදර ගුහාවේ දී ය. (2) ලංකාතිලක විහාරයේ දී ය.

(3) තිවංක පිළිමගෙයි දී ය. (4) කතලුව විහාරයේ දී ය.

(15) ගල් විහාරයේ හිටි බුද්ධ ප්‍රතිමාවෙන් නිරූපණය කරන්නේ,

(1) ධම්මචක්‍ර මුද්‍රාවය. (2) කටක හස්ත මුද්‍රාවය.

(3) පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාවය. (4) විතර්ක මුද්‍රාවය.

- **අංක 16 සිට 20 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.**

(16) ත්‍රිභංග - ..........................................................................................................

..........................................................................................................

(17) සන්නිදර්ශන චිත්‍ර - ..........................................................................................................

..........................................................................................................

(18) අඛණ්ඩ කථන - ..........................................................................................................

..........................................................................................................

(19) වකදෙක - ..........................................................................................................

..........................................................................................................

(20) විසංගත වර්ණ - ..........................................................................................................

..........................................................................................................

- ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් දී ඇති රූප සටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූප සටහන, ඉදිරියෙන් ඇති **A, B, C, D, E** යන රූපසටහන් අතුරෙන් තෝරා එයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ප්‍රශ්න අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| (21) |  | (..................) |  | A |
| (22) |  | (..................) |  | B |
| (23) |  | (..................) |  | C |
| (24) |  | (..................) |  | D |
| (25) |  | (..................) |  | E |

- අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය / වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(26) පහතරට විහාර චිත්‍රවල බහුල වශයෙන් පසුබිම සඳහා රක්ත වර්ණයට වඩා .................................................. වැනි වර්ණ භාවිත කර ඇත.

(27) පොළොන්නරු පුදබිමෙන් හමුවන අංක 02 ශිව දේවාලය 10 වන සියවසේ .................................................. පාලන සමයේ ඉදිකරන ලද්දක් ලෙස සැලකේ.

(28) හින්දු ආගමික මූර්තියක් වූ නටරාජා මූර්තියේ දකුණු පහළ හස්තයෙන් ............................................ මුද්‍රාව නිරූපණය කරයි.

(29) මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන්ට අනුව, ඉසුරුමුණි රජ පවුල කැටයම තුළින් .................................. නිරූපණය කරනු ලබයි.

(30) ඉවතලන / සොයාගත් ද්‍රව්‍ය උපයෝගි කරගනිමින් නිර්මාණය කර ඇති .................................................... මූර්තියට ඝණිකවාදී කලා ලක්‍ෂණ ආභාසය වී ඇති බව විචාරක මතය යි.

- **අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට F, G, H, I, J යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.**



F



G



H



I



J

(31) F අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය හඳුන්වනුයේ ........................................................................... ලෙසයි.

(32) G අක්ෂරයෙන් දැක්වෙන සිතුවම ඇති විහාරස්ථානය වනුයේ ....................................................... යි.

(33) H අක්ෂරයෙන් දැක්වෙන සිතුවම නිර්මාණය කළ නිර්මාණ ශිල්පියා වනුයේ ........................................ යි.

(34) I අක්ෂරයෙන් දැක්වෙන දළදා මැදුරේ ඇති දේවේන්ද්‍ර මූලාචාරී ශිල්පියා විසින් නිර්මාණය කළ සුවිශේෂී ගෘහ නිර්මාණ අංගය වන්නේ .................................................................................................... ය.

(35) J අක්ෂරයෙන් දැක්වෙන ''යකැදුරාගේ දියණිය'' සිතුවම සඳහා ආලෝකය යෙදීම සඳහා ශිල්පියා භාවිත කළ ශිල්ප ක්‍රමය වන්නේ, ................................................................................................ ය.

- **පහත දක්වා ඇති චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළව අර්ථවත් වාක්‍ය 5 ක් ලියන්න. (පිළිතුරු විස්තරාත්මක වාක්‍යයකින් දැක්වීම අනිවාර්යය වේ. එසේ නොමැති පිළිතුරු සඳහා ලකුණු නොලැබේ.)**



(36) හඳුනාගත් බව -..........................................................................................

(37) ශිල්ප ක්‍රමය -..........................................................................................

(38) කලා ආභාසයක් -..........................................................................................

(39) ඉදිරිපත් කර ඇති විද්වත් මතයක් -..........................................................................

(40) කලාත්මක ලක්ෂණ -..........................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

11 ශ්‍රේණිය | චිත්‍ර - II | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි.

- ★ ඔබේ විභාග අංකය , පංතිය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලි ව සටහන් කරන්න.
- ★ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත සහිත චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- ★ දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය.
- ★ සියලුම ද්‍රව්‍ය ඇස්මට්ටමින් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත. එසේ නොතැබූ අවස්ථාවක් වුවහොත්, ඇඳීම පටන් ගැනීමට පෙර, විභාග ශාලාධිපතිට දැන්වීමට ඔබට අවසර තිබේ.

---

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

★ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට, චිත්‍රය නිර්මාණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා රළු කඩදාසියක් භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

★ **මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**

★ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- රේඛා අධ්‍යයනය
  1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේදී දක්වන කුසලතා
- වර්ණ චිත්‍රය
  2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම.
  3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය.
  4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම.
  5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාව
  6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

11 ශ්‍රේණිය

චිත්‍ර - ශාලාධිපති උපදෙස්

නම/ විභාග අංකය:

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

### ශාලාධිපතිට උපදෙස්

- පහත දක්වා ඇති ආකාරයට ද්‍රව්‍ය සම්පිණ්ඩනය සකස් කරන්න.
- ඇස් මට්ටමෙන් පහළ සිටින සේ ද්‍රව්‍ය සමූහය තබන්න.

### යෝජිත ද්‍රව්‍ය

01. පෙට්ටියක්
02. වීදුරු බෝතලයක්
03. කොටු සහිත රෙදි කැබැල්ලක්
04. වට්ටක්කා ගෙඩියක්
05. ඇන්තූරියම් කොළ 2 ක් හා මලක්
06. ආධාරකයක්



සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

11 ශ්‍රේණිය | චිත්‍ර - III | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය, පංතිය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටෙහි පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීමට භාවිත කළ හැකිය. (මකන දියර භාවිතය සුදුසු නැත.)

  ඇඳීමට සුදු කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ. (ජාතික මට්ටමේ විභාගයේදී පමණි.) (පළාත් මට්ටමේ තමන් විසින් සපයා ගත යුතුය.)

---

- 'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරා වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

### "අ" කොටස - චිත්‍ර සංරචනය

(01) විවාහ මංගල්‍යයක අසිරිය. (මහනුවර සම්ප්‍රදායේ සිතුවම් ශෛලියට අනුව)

(02) අස්වනු නෙළන ගොවි ගෙවිලියෝ

(03) නගරයේ ඉරිදා පොළ

(04) අලි බලන්න කැළේ ගිහින්

### "ආ" කොටස - මෝස්තර නිර්මාණය

(05) ස්වාභාවික මලක් ව්‍යුක්තරූපී හැඩතලයකට හරවා කැමති රටාවකට සම්පිණ්ඩනය කරමින් අඟල් 8 × 8 ප්‍රමාණයේ චීත්ත රෙද්දකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.

(06) නිදහස් හැඩතල යොදා ආයත චතුරස්‍රාකාර මේස රෙද්දක් සඳහා සුදුසු මුළුතල මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.

(07) විදුලි මේස ලාම්පුවකට සැලසුමක් ඇඳ වර්ණ කරන්න.

### "ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

(08) ''අතරමං වූ මුව පැංචා'' නමින් ළමා කතන්දර පොත් පිටකවරයක් සැලසුම් කරන්න. (මුල් පිටුව සනකම සහ පසු පිටුව ඇතුළත් විය යුතුයි.)

(09) පළතුරු බීම බෝතලයකට උචිත ලේබලයක් නිර්මාණය කරන්න.

(10) ''ළමා අයිතීන් සුරකිමු'' යන තේමාවට අර්ථවත් පෝස්ටරයක් ඇඳ වර්ණ කරන්න.

## පිළිතුරු පත්‍රය - I පත්‍රය (ලිඛිත)

(01) නිශ්ශංකලතා මණ්ඩපය (02) නිශ්ශංකමල්ල රජු

(03) ඍජුකෝණාස්‍රාකාර (ආයත චතුරශ්‍රාකාර) (04) බුබ්බුලාකාර

(05) ධර්මය ශ්‍රවණය කිරීම, දළදා වහන්සේ වන්දනාමාන කිරීම, පිරිත් ශ්‍රවණය

(06) ක්ෂණිකවාදය (07) හෙන්රි මුවර්

(08) ගනේශ්වරාචාර්ය

(09) වෛතීවසවරම් ශිව සුබ්‍රමනියම් (10) සකුන්තලා

(11) සෙනරත් පරණවිතාන (12) ලෝකඩ (13) අනුරාධපුර යුගය (14) තිවංක පිළිමගෙයි දී ය.

(15) පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව

(16) ගෙල, ඉඟ, දණ යන තුන් තැනින් නැමුණු ප්‍රතිමා හඳුන්වන නමකි.

(17) සන්නිදර්ශන චිත්‍ර යනු ගද්‍ය හෝ පද්‍ය කොටසකින් මතුවන අදහස වඩාත් තීව්‍ර කිරීම සඳහා නිදර්ශනාත්මක සිතුවම් භාවිතය.

(18) එකම තලය තීරුවලට බෙදා කතාව අඛණ්ඩව ගලා යන සේ චිත්‍ර ඇඳීමේ ක්‍රමය මෙලෙස හඳුන්වයි.

(19) වකදෙක - අතීතයේ චිත්‍ර ශිල්පීන් විසින් තම ගෝලයාට ඇඳීමට දෙනු ලබන ප්‍රථම අභ්‍යාසයයි.

(20) එකිනෙකට නොගැළපෙන වර්ණ (විරුද්ධ වර්ණ)

(21) C (22) A (23) E (24) B

(25) D (26) අළු, කළු, තද නිල් (27) චෝල (28) අභය මුද්‍රාව

(29) දුටුගැමුණු රජ පවුල (30) මිනිසා සහ බල්ලන් (31) කාරයික්කාල් අම්මෙයියාර් මූර්තිය

(32) කතළුව විහාරය (33) පැබ්ලෝ පිකාසෝ (34) පත්තිරුප්පුව

(35) කියරොස්කුරෝ (අඳුර තුළින් ආලෝකය මතුකර පෙන්වීම.)

(36) හඳුනාගත් බව - මෙම කැටයම ඉසුරුමුණි විහාරයේ පෙම් යුවල කැටයම නමින් හඳුන්වයි.

(37) නෙළීමේ ශිල්ප ක්‍රමය යටතේ හතරැස් ගල් පුවරුවක අර්ධ උන්නතව නෙලන ලද කැටයමකි.

(38) ඉන්දීය ගුප්ත කලා ආභාසයන් ලැබී ඇතිබව විශ්වාස කරයි.

(39) ශාලිය අශෝකමාලාවන් නිරූපණය වන බව / ශිව හා පාර්වතී නිරූපණය වන බව / බෝසතාණන්ගේ වේශයක් නිරූපණය වන බව / සෙබලෙක් හා ඔහුගේ පෙම්වතිය

(40) අලංකාර වස්ත්‍රාභරණයන්ගෙන් යුතු වීම. / ජීවී ශක්තියෙන් යුතු පිරිපුන් ශරීරයෙන් යුතු වීම. / ප්‍රේමය පිළිබඳ භාවාත්මක හැඟීම් නිරූපණය වන බව, ආදී ලක්ෂණ

පිළිතුරු පත්‍රය I පත්‍රය - 1 x 40 = 40

## II පත්‍රය - ස්වාභාවිකත්ව අධ්‍යයනය හා ද්‍රව්‍ය සම්පිණ්ඩනය ලකුණු දීමේ නිර්නායක

| | | |
|---|---|---|
| (1) | රේඛා අධ්‍යයනය | - ලකුණු 05 |
| (2) | ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත් සංචරනය කිරීමේ හැකියාව | - ලකුණු 05 |
| (3) | ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | - ලකුණු 05 |
| (4) | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාවලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස් මට්ටමක, අවකාශ භාවිතය) | - ලකුණු 05 |
| (5) | වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම | - ලකුණු 05 |
| (6) | චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ත නිමාව | - ලකුණු 05 |
| II වන ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | | - ලකුණු 30 |

## III පත්‍රය - "අ"කොටස - චිත්‍ර සංරචනය

**ලකුණු දීමේ නිර්ණායක**

(1) තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා ප්‍රකාශ කර ඇති අයුරු - ලකුණු 06

(2) මානව රූප හා සත්ව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරු - ලකුණු 06

(3) සිද්ධාන්ත භාවිතය (ත්‍රිමාණ ලක්ෂණ, පර්යාවලෝකය, පරිමාණය) - ලකුණු 06

(4) වර්ණ භාවිතයේ කුසලතා - ලකුණු 06

(5) අනුමත ශෛලියට අනුව චිත්‍රයේ සමස්ත නිමාව - ලකුණු 06

**මුළු ලකුණු** - ලකුණු 30

## III පත්‍රය "ආ"කොටස - මෝස්තර හා සැරසිලි නිර්මාණය

**ලකුණු දීමේ නිර්ණායක**

(1) මාතෘකාවට හා කාර්යයට උචිත අයුරින් නව්‍යතාවයකින් යුතුව සැළසුම් කිරීම. - ලකුණු 06

(2) පාරිභාරික අවශ්‍යතාවන්ට ගැළපෙන බව. - ලකුණු 06

(3) නිර්මාණාත්මක බව හා හැඩතල සමපිණ්ඩනය කිරීමේ හැකියාව - ලකුණු 06

(4) උචිත වරණ තෝරාගෙන භාවිත කිරීමේ හැකියාව - ලකුණු 06

(5) විචිත්‍රත්වය, චමත්කාර ජනක බව, සමස්ත නිමාව - ලකුණු 06

**මුළු ලකුණු** - ලකුණු 30

## III පත්‍රය "ඉ"කොටස - ග්‍රැෆික් චිත්‍ර

**ලකුණු දීමේ නිර්ණායක**

(1) මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් සැලසුම් කිරීම. - ලකුණු 06

(2) වාණිජමය හා කර්මාන්තයට උචිත අයුරින් සැලසුම් කිරීම. - ලකුණු 06

(3) රේඛා හා හැඩතල හා සැරසිලි අර්ථවත්ව භාවිත කිරීමේ හැකියාව - ලකුණු 06

(4) උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීම. - ලකුණු 06

(5) විචිත්‍රත්වය, චමත්කාරය හා සමස්ත නිමාව. - ලකුණු 06

**මුළු ලකුණු** - ලකුණු 30

| | | | | |
|---|---|---|---|---|
| **(i)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 40 |
| **(ii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| **(iii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| | | මුළු ලකුණු | = | 100 |